00031

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

පූර්ව පාසල් අධ්‍යාපනය පිළිබඳ උසස් සහතික පත්‍ර වැඩ සටහන

අවසාන පරීක්ෂණය - 2018

**ESC2222/EPA2422 -** ළමා අයිතිවාසිකම්

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2018.12.29 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.

## <u>1 වන කොටස</u>

01. 'ළමා අයිතිවාසිකම්' යන පදයෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?

02. 'ළමයා' යන පදය නිර්වචනය කළ හැක්කේ කෙසේ ද?

03. ළමයා හා සම්බන්ධව ඇති පරිදි 'අයිතිවාසිකම්' 'අවශ්‍යතා' හා 'වගකීම්' යන පද එකිනෙකින් වෙන්කොට දක්වන්න.

04. ඔබගේ ප්‍රජාව තුළ ළමුන්ගේ මනෝ සෞඛ්‍යය ඉටුකර දීමට බාධා කරන පරිසරාත්මක සාධක මොනවා ද?

05. දෙමාපියන් තුළ තම දරුවන්ට තම ආදරය පෙන්වීමට ඇති ආශාව සීමා කරන සාධක මොනවා ද?

06. ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් හඳුන්වාදීමට ගන්නා ලද ප්‍රයත්න විස්තර කරන්න.

07. ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් නියාමනය කිරීමේ කමිටුවෙහි භූමිකාව කුමක් ද?

08. ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය අනුමත කිරීමෙන් පසුව ළමා අයිතිවාසිකම් සහතික කිරීමට ශ්‍රී ලංකා රජය විසින් ගන්නා ලද පියවර පහක් (05) ලැයිස්තු ගත කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් සම්බන්ධව පහත දැක්වෙන කාල සීමාවන්හි ගනු ලැබූ ප්‍රධාන ක්‍රියාමාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න.

(අ) ප්‍රාග් - යටත්විජිත සමය

(ආ) පෘතුගීසි පාලන සමය

(ඇ) ලන්දේසි පාලන සමය

(ඈ) බ්‍රිතාන්‍ය පාලන සමය (ලකුණු 4 x 5 = 20)

10. (අ) 'ළමුන්ගේ සහභාගිත්ව අයිතිවාසිකම් ' යන පදය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ආ) එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය හා ශ්‍රී ලාංකික ළමා අධිකාරියට ඇතුළත් ව ඇති සහභාගිත්ව අයිතිවාසිකම් විස්තර කරන්න. (ලකුණු 07)

(ඇ) තරුණ පුද්ගලයන්ගේ පූර්ණ පෞරුෂ වර්ධනය සඳහා දායක වන තොරතුරු සෙවීමට හා ලබා ගැනීමට තීරණය කිරීමේ අයිතියෙහි ඇති වැදගත්කම පිළිබඳව සාකච්ඡා කරන්න. (ලකුණු 08)

11. (අ) ඵලදායී සංනිවේදනයට බාධා කරන සාධක පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ආ) ළමා අයිතිවාසිකම් පිළිබඳ තොරතුරු සන්නිවේදනය වැඩි දියුණු කිරීම ගත හැකි ක්‍රම පහක් **(05)** යෝජනා කරන්න. (ලකුණු 08)

(ඇ) ළමා අයිතිවාසිකම් වර්ධනය කරන්නෙකු ලෙස ගුරුවරයාගේ භූමිකාව වැඩි දියුණු කිරීම සඳහා යෝජනා පහක් **(05)** දක්වන්න. (ලකුණු 07)

12. (අ) එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියෙහි දක්වා ඇති අයිතිවාසිකම් පොකුරු හතර **(04)** මොනවා ද? (ලකුණු 04)

(ආ) එම අයිතිවාසිකම් පොකුරු එකිනෙකට සම්බන්ධව ඇත්තේ කෙසේදැයි නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 16)

13. (අ) 'වර්ධන හා සංවර්ධන අයිතිවාසිකම්' යන පදය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ආ) දෙමාපියන්, පෙර පාසල් ගුරුවරුන් හා රැකවරණය දෙන්නට ළමුන්ගේ වර්ධන හා සංවර්ධනය ඇති අයිතිවාසිකම සහතික කිරීමට දායක විය හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 15)

හිමිකම් ඇවිරිණි.